## 498 ලෝකේ රක්ෂණයෙති

ලෝකේ රක්ෂණයෙති මෝක්ෂ දොරටු යතුරෙති
පාපේ ඖෂධයෙති අප රකිනු ශ්‍රී කුරුසෙති

තිරාවාසි බයටා ලෝ සුදන ජයටා
සගයෙනා සැපටා පත්වේ මේ ලකුණටා

අන්ධ වූ වෝ එලිය දාසියෝ නිදාසය
ලබන්නේ කුරුසය ආනුභාවෙන් ස්ථිරය

දුගියන්ට මහිම අනතුරේ මිදීම
නොදන්නාට දැනීම හිමි වේ සැබැවින්ම

දේව පුත්‍රයා වන ජේසුගේම ජීවන
පූජාවෙන්ට යෙදුන මේම වේය ආසන